
# පොත්ගුලේ වගතුග



සකුන්තලා සෙනෙවිරත්න

# පොත්ගුලේ වගතුග

## පුස්තකාල හා විඥාපන විද්‍යාව ආශ්‍රිත ලිපි සමුච්චයකි

රුහුණ විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති

සකුන්තලා සෙනෙවිරත්න

MSSc. Library & Inf. Science (University of Kelaniya)

B.A. (Hon's) Library & Inf. Science (University of Kelaniya)

Dip. In Journalism (University of Colombo)

සීමාසහිත

ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ (පුද්.) සමාගම

ප්‍රථම මුද්‍රණය: 2018

පොත්ගුලේ වගතුග

© සකුන්තලා සෙනෙවිරත්න

ISBN 978-955-30-9317-2

කවර නිර්මාණය:

සිතාර ඉෂාන් ජයසිංහ

පරිගණක පිටු සැකසුම:

චමීර ඇල්ලදෙණිය සහ සිතාර ඉෂාන් ජයසිංහ

ප්‍රකාශනය:

සී/ස ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ (පුද්.) සමාගම

661, 665, 675, පී. ද ඇස්. කුලරත්න මාවත, කොළඹ 10.

මුද්‍රණය:

චතුර මුද්‍රණාලය

69, කුමාරදාස පෙදෙස, වැල්ලම්පිටිය.

19026/5526/500

# පෙරවදන

මානව වර්ගයාගේ ඉතිහාසය තරම්ම පැරණි පුස්තකාලය හා පුස්තකාල වෘත්තිය සම්බන්ධ ඓතිහාසික පසුබිම විමර්ශනය කරන විට එය ප්‍රාග් ඓතිහාසික යුගය දක්වා දිව යනු දක්නට ලැබෙයි. මෙම විෂය හා සම්බන්ධ විද්‍යාත්මක චින්තනය බටහිර ලෝකය හා සම්බන්ධ වන බව බොහෝ විද්වතුන්ගේ අදහසයි. එහෙත් බටහිරට වඩා අතිශයින් පැරණි ශිෂ්ටාචාරවලට උරුමකම් කියන ආසියාතික සමාජවල දැනුම සංවිධානය, සංරක්ෂණය හා එම දැනුම් සම්භාරය අන්තර්ගතකොට ග්‍රන්ථ සම්පාදනය කර පවත්වාගෙන යාම පෙරදිග ලෝකයේ ඈත අතීතයේ සිටම සිදුව ඇති බව වර්තමානය වන විට සාධක සහිතව තහවුරු වී ඇත.

අපට ආසන්න මහා සභ්‍යත්වය වූ ඉන්දීය උප මහාද්වීපයේ දිසාපාමොක් වැනි ආචාර්ය පරම්පරා විසින් තම විද්‍යාස්ථානවල තමන් සතු ඥාන සම්භාරය සුරැකිව පවත්වාගෙන යාම සඳහා යම් කාර්යය භාරයක් සිදු කරන්නට ඇත. අවාසනාවකට එම යාන්ත්‍රණය පිළිබඳව අද වනතුරු අපට සාක්ෂි නොමැතිවීම නිසා පුරාණ භාරතයේ පැවති පුස්තකාල සම්ප්‍රදාය පිළිබඳව අපට නිශ්චිත අදහසක් පළ කළ නොහැකි වී ඇත. එහෙත් මෙසපොතේමියානු ශිෂ්ටාචාරයෙහි පැවති මැටිපුවරු පිළිබඳව තොරතුරු රැසක් අනාවරණය වීම තුළින් අතීත පුස්තකාල හා පුස්තකාල වෘත්තිය පිළිබඳව යම් අදහසක් අපට ඇති කර ගත හැකිව තිබේ.

පුස්තකාල හා විඥාපන විද්‍යාව විෂයය වූ කලී පුළුල් පරාසයක් පුරා පැතිරුණු විෂය පථයකි. මෙම විෂය ක්ෂේත්‍රය පිළිබඳව සිංහල මාධ්‍ය පාඨකයාගේ අවබෝධය මෑතක් වන තුරුම පැවතියේ ඉතා සීමිත මට්ටමකය. පසුගිය සියවසේ අවසාන භාගයේ සිට පුස්තකාල හා විඥාපන විද්‍යා විෂය සම්බන්ධයෙන් සිංහල මාධ්‍ය පොතපත බිහිවීම තරමක් සතුටුදායක තත්ත්වයක පවතී. වත්මන් ලෝකය තොරතුරු සමාජයක් බවට පත්ව ඇති අතර එම

තොරතුරු සමාජය තුළ තොරතුරු බිහිවීමේ වේගය ද පෙර නොවූ විරූ අයුරින් වේගවත් වී ඇත. එපමණක් නොව විවිධ සමාජ මාධ්‍ය, වෙබ් අඩවි ඔස්සේ තොරතුරු සමාජයට ගලා එයි. එම නිසා සාම්ප්‍රදායික තොරතුරු ප්‍රකාශන මාධ්‍ය වූ පොතපතට පාඨකයා ඇදගැනීම අසීරු වී ඇත. මෙවන් පසුබිමක් හමුවේ මුද්‍රිත මාධ්‍ය තුළ පාඨකයා රඳවා තබා ගැනීමට පුස්තකාල වෘත්තිකයන්ට දැඩි වෙහෙසක් දැරීමට සිදුව තිබේ. පුස්තකාල වෘත්තිකයන්ට පැවරෙන වගකීම් සම්භාරය අතර පුස්තකාලයට පාඨකයා ගෙන්වා ගැනීම මෙන්ම කියවීමේ රුචිකත්වය වර්ධනය කිරීම ද සිදු කළ යුතුව ඇත. පුස්තකාල වෘත්තිකයන් ඒ සඳහා ගත යුතු ක්‍රියාමාර්ග අතර සුදුසු මුද්‍රිත මාධ්‍ය පොත්පත් බිහි කිරීම කෙරෙහිද අවධානය යොමු කළ යුතුය.

එම වගකීම තේරුම්ගත් නවක පුස්තකාල වෘත්තියවේදිනියක් ලෙස සකුන්තලා සෙනෙවිරත්න මහත්මියගේ මෙම කුළුඳුල් ප්‍රයත්නය බෙහෙවින්ම ප්‍රශංසනීයය. කැලණිය විශ්වවිද්‍යාලයේ පුස්තකාල හා විඥාපන විද්‍යා උපාධිධාරිනියක් ලෙසත් එම ක්ෂේත්‍රයේම පශ්චාත් උපාධිධාරිනියක් ලෙසත් ශික්ෂණය ලැබූ කතුවරිය පුස්තකාල හා විඥාපන විද්‍යාවේ පුළුල් විෂය ධාරාවන් වූ සම්පත් සංවිධානය, සූචිකරණය, වර්ගීකරණය වැනි වූ විෂය ක්ෂේත්‍රවලට වඩා සාමාන්‍ය සිංහල මාධ්‍ය පාඨකයන්ගේ අවධානය දිනාගත හැකි මාතෘකා ඔස්සේ මෙම කෘතිය හසුරුවා තිබේ. එය පුස්තකාල විද්‍යාව පිළිබඳ න්‍යායාත්මක කරුණුවලට වඩා පුස්තකාලය හැදෑරීම වෙත පාඨකයා යොමු කරවීමට සමත් මාතෘකා ඇතුළත් ග්‍රන්ථයක් ලෙස හඳුන්වා දීම වඩාත් උචිත යැයි හැඟෙයි. සරල රචනා ශෛලියත්, භාෂා ව්‍යවහාරයත් එම උත්සාහය තව තවත් ඔපවත් කර ඇත. කතුවරිය දැරූ මෙම ප්‍රයත්නය අතිශයින්ම ප්‍රශංසනීය වන අතර "පොත්ගුලේ වගතුග" කෘතිය පාඨකයා පුස්තකාලයට ප්‍රවේශ කරවන දොරටුවක් වනු ඇති බව අපගේ විශ්වාසයයි.

ආනන්ද කරුණාරත්න
පුස්තකාලයාධිපති
රුහුණ විශ්වවිද්‍යාලය

# පටුන


පෙරවදන

හැඳින්වීම

01. පොත් ගුල්ලොත් පොත් කාවොත් මිනිස්සුමයි 13

02. කියවීම නංවන්නේ කෙසේද? 17

03. පාසලක හදවත පුස්තකාලයයි 25

04. සෑම පුස්තකාලයකම පුස්තකාල සතියක් ආරම්භ කළ යුතුයි 31

05. වරක් නොව දෙවරක්ම ගිනි රකුසාට බිලි වූ යාපාපටුනේ මහා පොත්ගුල 34

06. සාහිත්‍යය බිතර මාසයට පමණක් සීමා කරමුද? 40

07. පුස්තකාල විද්‍යාවේ ශ්‍රී ලාංකේය මුද්‍රාව : ජ්‍යෙෂ්ඨ මහාචාර්ය පියදාස රණසිංහ 45

08. ශ්‍රී ලංකාවේ පොත් කර්මාන්තයේ හෙට දවස කොතැනද? 53

09. මිනිස් ඝාතනයට ගොදුරු වූ දැනුම් මන්දිර 58

10. කියවන පරිසරයක්...ගෘහස්ථ පුස්තකාලයක්... 65

11. අනාගත පුස්තකාලවල මුද්‍රිත පොතපතට හිමි තැන සීමාවේද? 70

12. අධ්‍යාපනයේ නියමුවා පුස්තකාලයයි 75

13. විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන්ද පුස්තකාලයක කොටස්කරුවන් කරමු 81

14. පැරණි ලංකාවේ ආරාම අධ්‍යාපනය, පුස්තකාල සංවර්ධනය හා ඊට බල පෑ රාජ්‍ය අනුග්‍රහය සහ පුස්තකාල පරිහානිය 87

15. කියවන නුවණට මඟ සදන පුස්තකාලය 99

16 අත් බෑගයත් ජංගම පුස්තකාලයක් කර ගනිමු 103

17. ගංවතුරට බිලි වූ පොතපත රැක ගන්නේ කෙසේද? 106

18. පොත් අපේ නෙත් වගේ රැක ගනිමු පණ වගේ 108



# පොත්ගුලේ වගතුග

සකුන්තලා සෙනෙවිරත්න

කෑගල්ල දිස්ත්‍රික්කයේ කැන්දව ප්‍රාථමික විද්‍යාලය, තුම්බාගේ මහා විද්‍යාලය හා තෝලංගමුව ඩඩ්ලි සේනානායක මධ්‍ය මහා විද්‍යාලයෙන් පාසල් අධ්‍යාපනය ලද සකුන්තලා සෙනෙවිරත්න කැලණිය විශ්වවිද්‍යාලයෙන් ගෞරව සාමාර්ථයක් සහිතව පුස්තකාල හා විඥාපන විද්‍යාව විශේෂ ශාස්ත්‍රවේදී උපාධියත්, එම විශ්වවිද්‍යාලයෙන්ම සමාජීය විද්‍යාපති උපාධියත් හිමි කර ගත්තාය. කොළඹ විශ්වවිද්‍යාලයෙන් පුවත්පත් කලාව පිළිබඳ ඩිප්ලෝමාව ද ලබා ගත් ඇය මෙරට ජාතික පුවත්පත්වල පුස්තකාල විද්‍යා විෂයට අදාළ කාලීන මාතෘකා ඔස්සේ ලිපි රැසක් පළ කර ඇත. දේශීය හා ජාත්‍යන්තර සම්මන්ත්‍රණ රැසකට සහභාගි වී ඇති ඇය මෙම විෂයට අදාළව පර්යේෂණ පත්‍රිකා රාශියක් ද ප්‍රකාශයට පත් කර ඇත. මේ වන විට ඇය රුහුණු විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපතිනියක ලෙස සේවය කරයි.

කතුවරිය විසින් රචිත "පොත්ගුලේ වගතුග" නමැති කෘතිය පාඨකයා හා පුස්තකාලය අතර මනා සබඳතාවක් ගොඩනැගීමට හැකි වන සේ සරල බස් වහරකින් හා පාඨකයාගේ හදවතට දැනෙන ආකාරයෙන් සිය අදහස් ප්‍රකාශ කිරීමට සමත් වී ඇත. පුස්තකාල විද්‍යාවේ න්‍යායාත්මක කරුණු වලින් ඔබ්බට ගොස් පුස්තකාලය හා එය භාවිතයේ ඇති වටිනාකම පිළිබඳ මෙම කෘතියෙන් පෙන්වා දෙයි. පුස්තකාල විද්‍යා විෂය පිළිබඳ පොත්පත් විරල අවධියක පාඨකයාගේ දැනුම් පිපාසය සංසිඳවීමට ඇය විසින් ගත් උත්සාහය පැසසිය යුතුය.

**ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ගාමිණී සේනානායක**
උප කුලපති
රුහුණු විශ්වවිද්‍යාලය


250/-

ISBN 978-955-30-9317-2

**සී/ස ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ (පුද්.) සමාගම**
රාජ්‍ය සම්මාන ලත් පොත් ප්‍රකාශකයෝ
661, 665, 675, පී. ද ඇස්. කුලරත්න මාවත, කොළඹ 10.
දුරකථන: (011) 2685369, 2686925 ෆැක්ස්: 2674187
www.godage.com godageem@slt.lk

කවර නිර්මාණය: සිතාර ඉෂාන් ජයසිංහ